**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 03 - 2023**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 03 හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව සමඟ 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3348- SRI දරන ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 03 ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගිවිසුම හා ණය ගිවිසුම අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන - ව්‍යාපෘති 03හි ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - ව්‍යාපෘතියෙහි ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහන - ව්‍යාපෘති 03හි අරමුණ වනුයේ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීම හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහන - ව්‍යාපෘති 03හි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 29,642.60 කට සමාන එජඩො මිලියන 228.02 ක් වූ අතර ඉන් රු.මිලියන 15,990 කට සමාන එජඩො මිලියන 123 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 650 කට සමාන එජඩො මිලියන 05 ක් ආසියානු සංවර්ධන අරමුදලේ විශේෂ අරමුදල් සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඊට අමතරව, රු.මිලියන 7,742.80 කට සමාන එජඩො. මිලියන 59.56 ක් යුරෝපීය ආයෝජන බැංකුව (යු.ආ.බැ) මඟින් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 5,259.80 කට සමාන එජඩො මිලියන 40.46 ක් ශ්‍රී ලංකා රජය විසින් දායකවීමට අපේක්ෂා කර තිබුණි. තවද වැඩසටහන - ව්‍යාපෘති 03හි මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 7,231.90 කට සමාන එජඩො මිලියන 55.63 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 22,410.70 කට සමාන එජඩො මිලියන 172.39 ක මුදලක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 ජූනි 30 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් අනතුරුව වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාල සීමාව 2024 පෙබරවාරි 29 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගනනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| අ) | ආසියානු සංවර්ධන බැංකුවේ ණය අංක 3349-SRI යටතේ කොළඹ මහනගර සභාවට ලබා දුන් රුපියල් මිලියන 500ක උපයෝජනය නොකල ශේෂය මෙම ව්‍යාපෘතියේ ඉතිරි කාර්යයන් අවසන් කිරීම සඳහා ADB සහ ERD යන ආයතන වල අනුමැතිය මත යොදා ගන්නා ලදී. මෙම ණය මුදල ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වෙනම මූල්‍යකරණ වගකීමක් ලෙස සඳහන් කරනවා වෙනුවට ව්‍යාපෘතියේ පවතින ණය ගිණුම තුලම ගිණුම්ගත කර තිබුණි. | **500** | ණය අංක 3349-SRI අපගේ ව්‍යාපෘතියට ලබා නොදුන් බැවින් එය වෙනම ණයක් ලෙස සඳහන් කිරීමට අපට හැකියාවක් නොමැත. එය ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කොළඹ මහ නගර සභාව වෙතින් ලද ඇ.ඩොලර් මිලියන 3.5 ක අරමුදලකි. එබැවින් 3349-SRI ණය යටතේ සිදු කරන ලද වියදම් ණය කේතය සඳහන් නොකර ව්‍යාපෘති 3 යටතේ ගිණුම්ගත කර ඇත. | මෙම අරමුදල් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන තුල වෙනම අරමුදල් මූලාශ්‍රයක් ලෙස හඳුනාගැනීමට ක්‍රියා කළ යුතුය. |
| ආ) | අයි.සී.බී 01 කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු රුපියල් මිලියන 698 ක බිල්පතක් , කරන ලද වැඩ සහතිකය, ගෙවීම සඳහා අවසන් අනුමැතිය සහ මෙම ගනුදෙනුව තහවුරු කිරීමට ආධාරක ලියකියවිලි කිසිවක් නොමැතිව අවසන් බිල්පතක් ලෙස ඇතුලත් කර තිබුණි. | 698 | වත්කම් ප්‍රාග්ධනීකරණය අවසන් කිරීමට සහ අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දිනට අයි.සී.බී -01 කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු මුදල ලෙස රු.මිලියන 698 ක් ඇස්තමේන්තුගත කොට ගිණුම්ගත කරන ලදී. 2024 වර්ෂය ආරම්භයේදී අවසන් බිල් පත් වටිනාකම ගෙවීමට සහතික කල පසු ගිණුම් ගතකල ඇස්තමේන්තුගත වටානාකම වෙනුවට සත්‍ය වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | සියලුම ගිණුම් සටහන් කිරීම් උපකාරක ලියකියවිලි සමඟ සත්‍යාපනය කළ යුතුය |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

| අංකය | නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි අංක 502(2). | ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගත් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත, ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සිදු වෙමින් පවතී | ස්ථාවර වත්කම් මිලදී ගැනීම් පිළිබඳ වාර්තා තබා ගැනීම මෙනම සහ ප්‍රධාන කාර්යාලයට පැවරූ වත්කම් පිළිබඳ විස්තර තබා ගැනීම මෙන්ම ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි අංක 128(1) ඉ, 507 සහ 756 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය සම්පූර්ණ කළ යුතු වුවද, එය 2024 අප්‍රේල් 10 විගණන දිනය වන විටත් සිදු කර නොතිබුණි. | එකඟ වේ. භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවරගත යුතුය. |

## 3. භෞතික හා මූල්‍ය කාර්ය සාධනය

### 3.1 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 03 කින් සමන්විත වූ අතර එම සංරචක 03 හි ක්‍රියාකාරකම් සඳහා ඇ.ඩො.මි. 38 ට සමාන රු.මි. 4,940 ක් වෙන්කර තිබුණි. එයින් ව්‍යාපෘති 01 හා 02 හි මූල්‍ය පරතරය පියවීම සඳහා අතිරේක මූල්‍යකරණයට ඇ.ඩො.මි. 35 ට සමාන රු.මි. 4,550 ක් ද ඉතිරි ඇ.ඩො.මි. 03 ට සමාන රු.මි. 390 ක් ව්‍යාපෘති සංවර්ධන ආධාරක කටයුතු සඳහාද වෙන්කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය ආරම්භ වී 2023 දෙසැම්බර් 31 දිනට වසර 07 ක් ගතවී ඇතත් ඇ.ඩො.මිලියන 38 න් සියයට 78.52 ක් නියෝජනය කරන ඇ.ඩො.මි. 29.84 ට සමාන රු.මි. 7,825.43 ක් (පවතින විනිමය අනුපාතය අනුව) පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ උපදේශකගේ නිර්දේශය ලබා ගැනීමකින් තොරව විචලතා නියෝගයක් හරහා ව්‍යාපෘති කාල දීර්ඝ කිරීම් හිමිකම් වෙනුවෙන් අයි.සී.බී 01 සහ අයි.සී.බී 02 ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන්ට පිළිවෙලින් ඇ.ඩොලර් 385,759.65 - රු. | අයි.සී.බී -01 සහ අයි.සී.බී -2 හි ව්‍යාපෘති දීර්ඝ කිරීමේ හිමිකම් ඇගැයීමේදී, ව්‍යාපෘති උපදේශකයින් විසින් හිමිකම් ඇගයීමට ලක් කර සහ ගෙවීමට නිර්දේශ කොට ව්‍යාපෘති | ව්‍යාපෘති විචලතා කමිටුවට ලබා දී ඇති අධිකාරී සීමාව තුළ එවැනි ගෙවීම් අනුමත කළ යුතුය. විශේෂ අවශ්‍යතාවයක් තිබේ නම්, අරමුදල් මුදා හැරීමට පෙර අදාළ බලධාරීන්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මිලියන 345 ක් සහ ඇ.ඩොලර් 1,637,367.61 - රු. මිලියන 89.7 ක් ද, අයි.සී.බී 03 කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 436.48 ක් කාල දිගුවන් පාදක කර ගනිමින් ආසියනු සංවර්ධන බැංකුවෙන් ලද අරමුදල් භාවිතා කර ගෙවා තිබුණි. | විවලා කමිටුව වෙත භාර දුනි. | |
| ආ) | අයි.සී.බී 3 ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් විවලතා නියෝග හරහා කාලය දීර්ඝ කිරීමේ හිමිකම් ලෙස ඇ.ඩොලර් 372,488 ක් සහ රු. මිලියන 505.99 ක් ඉල්ලුම් කර තිබූ අතර කෙසේවෙතත් ව්‍යාපෘතිය මගින් ඇ. ඩොලර් 1,023,338 ක් සහ රු. මිලියන 98.21 ට සමාන රු. මිලියන 436.48 ක් ගෙවා තිබුණි. ඒ අනුව නිසි අනුමැතියකින් තොරව සහ රට තුළ පවතින විදේශ විනිමය අර්බුදය සැලකිල්ලට නොගෙන, ඉල්ලුම් කළ මුදල පියවීම සඳහා ව්‍යාපෘතිය, කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටි ඇ.ඩොලර් ප්‍රමාණයට වඩා ඇ.ඩොලර් 650,850 ක් වැඩිපුර ගෙවා තිබුණි. මීට අමතරව, අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි උල්ලංඝනය කරමින් ජල සම්පාදන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරයා විසින් ඉහත ගෙවීමට ඉදිරිපත්කල රු. මිලියන 436 ක් වටිනා විවලා නියෝගය ගෙවීමට නිර්දේශ කරමින් සහ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය වෙනුවටද අත්සන් යොදා තිබුණි. | අයි.සී.බී -3 කොන්ත්‍රාත්තුව සඳහා ව්‍යාපෘතිය දිගු කිරීමේ හිමිකම් ඇගැයීමේදී, එය කාල දිගු වාර – 7 දක්වා සලකා බලන ලදී. ඒ අතර කොන්ත්‍රාත්කරු වීන යුආන් 50,822,695.83 සහ ඇ.ඩොලර් 131,635.49 සහ රුපියල් 621,468,876.68 ක් ඉල්ලීම් කරන ලදී. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවට අනුව ගෙවීම් සහතික කළ හැක්කේ ඇ.ඩොලර් සහ රුපියල් වලින් පමණි. එබැවින් ඇ.ඩොලර් 1,023,338 සහ රුපියල් 98,211,794.09 ක් නිර්දේශ කරන ලදී. තවද, අනුමැතිය ලබා දෙන කාල පරිච්ඡේදය තුළදී අතිරේක සාමාන්‍යාධිකාරී (ඩබ්ලිව්.එස්.පී), මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා වෙනුවෙන් රාජකාරී ආවරණය කිරීමේ කටයුතු වල නියුතුව සිටියේය. | අභ්‍යන්තර ක්‍රියා පරිපාටි අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඇ) | කාල දීර්ඝ කිරීමේ එකඟතාවයන්ට අනුව, කොන්ත්‍රාත් වටිනාකම හැර වෙනත් කිසිදු අමතර පිරිවැයක් ඉල්ලා සිටීමට අයිතියක් නොමැති බවට කොන්ත්‍රාත්කරුවන් එකඟ වී ඇතත්, කොන්ත්‍රාත්කරුගේ විචල්‍ය හිමිකම් සඳහා රු. මිලියන 532.91 සහ ඇ.ඩොලර් 3,046,465.26 ක් ඉහත කොන්දේසිය උල්ලංඝනය කරමින් ගෙවීම් කර තිබුණි. | ෆිඩික් හි පොදු කොන්දේසිය 8.4 ට අනුව කොන්ත්‍රාත්කරුට 20.1 උප වගන්තියට යටත්ව [කොන්ත්‍රාත්කරුගේ හිමිකම්] 10.1 උප වගන්තියේ (වැඩ සහ අංශ භාර ගැනීම්) අරමුණු සම්පූර්ණ කර ගැනීම සඳහා කාලය දීර්ඝ කිරීමට හිමිකම් ඇත. මේ සඳහා පහත සඳහන් ඕනෑම හේතුවක් නිසා ප්‍රමාද විය හැක : විචලතාවයක්, වසංගත හෝ රජයේ ක්‍රියා හේතුවෙන් ඇති වූ පිරිස් හෝ භාණ්ඩ ලබා ගැනීමේ අනපේක්ෂිත හිඟය ආදිය.<br>කාල දිගු වාර ලබා දෙන විට, ඉහත නිර්ණායක මත පදනම්ව ඇගයීම සිදු කරන ලදී. ඒ අනුව, සේවායෝජකයා සමහර කාල දිගුවන් සඳහා කාලය සහ පිරිවැය යන දෙකටම එකඟ වූ අතර සමහර අවස්ථාවලදී කාලය පමණක් ලබා දීමට එකඟවන ලදී. | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වය/අකාර්යක්ෂමතාව සහ අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය.<br>. |
| ඈ) | අයි.සී.බී 01 සහ අයි.සී.බී 02 කොන්ත්‍රාත්තුවල භෞතික වැඩ පිළිවෙලින් 2022 මාර්තු 15 සහ 2022 මැයි 21 දින අවසන් කර තිබුණද, ව්‍යාපෘතිය මගින් 2024 මැයි මස විගණනය කරන ලද දින වන විටත් අවසන් බිල් පත් ගෙවීම් සිදු කර නොතිබුණි.<br>තවද ඉහත කොන්ත්‍රාත් දෙක අවසන් කර වසර 2ක් ගතවී ඇතත් අවසාන බිල්පත් පියවීමට පෙර ෆිඩික් කොන්දේසි 7.6 | අයි.සී.බී -01 සහ ICB-02 හි කොන්ත්‍රාත් සඳහා ප්‍රතිපාදන මුදල වැඩි කිරීමට අවශ්‍යය වූ අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය අවශ්‍ය විය. ඒ අනුව ව්‍යාපෘතිය 2024 පෙබරවාරි මාසයේදී කොන්ත්‍රාත්තු සඳහා ප්‍රතිපාදන මුදල වැඩි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය | අයි.සී.බී 01 සහ අයි.සී.බී 02 කොන්ත්‍රාත්තුවල ප්‍රතිපාදන ඉක්මවූ ගෙවීම් සඳහා මෙන්ම අයි.සී.බී 03 සහ අයි.සී.බී 04 කොන්ත්‍රාත්තුවල අමතර ගෙවීම් සඳහාද අදාළ අනුමැතිය ලබා ගැනීමට වහාම ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| වගන්තිය අනුව අවසාන අමුද්‍රව්‍ය සැසඳුම් වාර්තාව පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ලබාගෙන ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියට මාස 12 කට අධික කාලයක් ගත විය. තවද ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගේ අවසන් බිල්පත්වල අඩුපාඩු පැවතීම ප්‍රමාදයට හේතු වූ අතර අයි.සී.බී -01 සහ අයි.සී.බී -02 අවසන් බිල්පත් දෙකම අවසන් අදියරේ ඇත.<br>ද්‍රව්‍ය සංසන්දනයද බිල්පත් ගෙවීම් අවසන් කිරීම සමග සෘජුව සම්බන්ධ වන අතර අයි.සී.බී -01 සහ අයි.සී.බී - 02 දෙකෙහිම සැසඳුම් වාර්තා අවසන් කර ඇත. | |

### 3.3 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්, ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම සහ අරමුදල් ඌන උපයෝජනය

| **විගණන නිරීක්ෂණය** | **කළමණාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|
| මෙම වාර්තාවේ 3.1 ඡේදයේ සඳහන් කර ඇති පරිදි ව්‍යාපෘතියේ මන්දගාමී කාර්ය සාධනයේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රතිපාදන වියපැහැදම් කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයන් පෙන්නුම් කළ අතර, ඒ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට බැදීම්ගාස්තු ලෙස රුපියල් මිලියන 183ක් රජයට ගෙවීමට සිදුව තිබුණි. | 2016 අගෝස්තු සිට බලපැවැත්වෙන අංක 3348-SRI දරන ණය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙහි සමුච්චිත බැදීම් ගාස්තුව 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 183 කි. අංක 3348-SRI දරන මෙම ණය, ලබාගෙන ඇත්තේ අංක 2947-SRI සහ අංක 3029-SRI යන ණය ප්‍රතිපාදන වලට අතිරේක අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා ය. අංක 3348-SRI ණය භාවිතා කිරීමට එම ණය සංරචක වල ප්‍රතිපාදන අවසන් කළ යුතු විය. කෙසේ වෙතත්, විවිධ හේතුන් නිසා අංක 2947-SRI සහ අංක 3029-SRI දරන ණය උපයෝජනය අපේක්ෂා කළ පරිදි සිදු නොවූ අතර එබැවින් අංක 3348-SRI දරන ණය ප්‍රතිපාදන භාවිතා කිරීම ප්‍රමාදවීම මත ADB වෙත බැදීම් ගාස්තු ගෙවීමට සිදු විය. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු අතර අනාර්ථික වියදම් පාලනය කල යුතුය. |

## 3.4 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| 2010 ජූලි 26 දින අංක 05 කළමනාකරණ චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාල සීමාව තුළ වරින් වර එහි විගණනය සිදු කර තිබුණි | අභ්‍යන්තර විගණනය අඛණ්ඩව සිදුකිරීමට කටයුතු කළ යුතුයි |